සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 13 Second Term Test, March 2020**

භූගෝල විද්‍යාව - I

**Geography - I**

22 S I

පැය 03 යි

**Time: 03 hours**

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

උපදෙස්

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ.
I කොටස බහුවරණ ප්‍රශ්න 40කින් යුක්ත වන අතර එයට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුය.
I කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමි වේ.
II කොටසෙහි ප්‍රශ්න දෙකටම පිළිතුරු සැපයිය යුතුය.
III කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුය.

## I කොටස

01. ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියමක දිග හා පළල නිවැරදිව දැක්වෙන්නේ මින් කවර පිළිතුරේද?

I. සෙ. මී. 80 X 40 II. සෙ. මී. 60 X 25 III. සෙ. මී. 40 X 25
IV. සෙ. මී. 80 X 50 V. සෙ. මී. 50 X 25

( )

02. 1:50, 000 භූ ලක්ෂණ සිතියමක $4cm^2$ ප්‍රදේශයක් මගින් සැබෑ භූමියේ කොපමණ බිම් ප්‍රමාණයක් නිරූපිතද?

I. ව.කි.මී. 1 II. ව.කි.මී. 4 III. ව.කි.මී. 16
IV. ව.කි.මී. 2 V. ව.කි.මී. 8

( )

03. පහත රූප සටහනෙන් දැක්වෙන්නේ 1:50 000 භූ ලක්ෂණ සිතියමක් සඳහා අඳින ලද හරස් කඩකි. එහි A, B, C, D, ලෙස නම් කර ඇති ස්ථානවල භූ ලක්ෂණ නිවරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,




I. A අවතල බෑවුම B මොහොර බෑවුම C මද බෑවුම Dකපොල්ල
II. A මද බෑවුම Bමොහොර බෑවුම C කපොල්ල Dඅවතල බෑවුම
III. A මොහොර බෑවුමB මද බෑවුම Cකපොල්ල Dඅවතල බෑවුම
IV. A මද බෑවුම B කපොල්ල C මොහොර බෑවුමD අවතල බෑවුම
V. A මද බෑවුම B අවතල බෑවුම C කපොල්ල D මොහොර බෑවුම

( )

04. කඳු වැටි විහිදෙන දිශාවට සමාන්තරව විහිදෙන නිම්න ලක්ෂණයකි.

I. ආයතනගාමී නිම්නය II. තීර්යක් නිම්නය III. ගංගා නිම්නය
IV. නිම්නය V. V හැඩ නිම්නය

( )

05. විවික්ත දත්ත මගින් දැක්වෙන විචල්‍ය තුනක් නිවරදිව සඳහන් වන පිළිතුර කුමක් ද?

I. සංචාරකයන්ගේ පැමිණීම, විල් සංඛ්‍යාව, පවුලේ ළමයින් සංඛ්‍යාව
II. උස, භූමි පරිහරණය, දුර
III. වර්ෂණය, උන්නතාංශය, පාංශු තෙතමනය
IV. බර, භූමි පරිහරණය, වාෂ්පීකරණය
V. පාංශු තෙතමනය, වාෂ්පීකරණය,කාලය

( )

06. නියැදියක් යනු,

I. සංගහනයක ඇති සියලුම මිණුම් වල කුලකයයි.
II. සංගහනයෙන් තෝරා ගත් මිණුම් වල කුලකයයි.
III. තොරතුරු විශ්ලේෂණයේදී අඩුවෙන්ම භාවිතයට ගන්නා ක්‍රමවේදයයි.
IV සීමිත සංගහනයක් සඳහා භාවිතා කරන ක්‍රමවේදයයි.
V. දත්ත ජනනයේදී භාවිතා කරනු ලබන්නක් නොවේ.

( )

07. සමූහික දත්ත ඇසුරෙන් මධ්‍යස්ථය ගණනය කරන සූත්‍රය වන්නේ,

i. $\sqrt{\frac{\Sigma (X-\bar{X})}{n}}$ ii. $\frac{\Sigma|x-\bar{x}|}{n}$

iii. $X_0 + \frac{(\Sigma fd)}{n} C$ iv. $l + \left(\frac{\frac{N}{2} - fb}{fw}\right) C$

v. $\frac{\Sigma fx}{n}$

( )

08. අභ්‍යවකාශ උපාංග සහ පාලක උපාංග අයිති වන්නේ, මින් කවර ක්‍රියාවලියක් සඳහා ද?

I. භූගෝලීය තොරතුරු පද්ධති සඳහා II. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධති සඳහා
III. තොරතුරු ත්‍රිමාණව සටහන් කිරීම සඳහා IV. දත්ත ගබඩා කිරීම සඳහා
V. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා

( )

09. GIS (Geographical Information System )හෙවත් භූගෝලීය තොරතුරු පද්ධතියක අඩංගු ප්‍රධාන සංරචක වන්නේ,

I. තොරතුරු ගබඩා කිරීම, නැවත ලබා ගැනීම, මෙහෙයවීම, ප්‍රදර්ශනය කිරීම.
II. දත්ත, දෘඩාංග, මෘදුකාංග, ක්‍රමවේද
III. පරාවර්තනය, විමෝචනය, ග්‍රහණය කිරීම, විශ්ලේෂණය
IV. අභ්‍යවකාශ යානා, අජටාකාශ මධ්‍යස්ථාන, චන්ද්‍රිකා, පහළ මට්ටමේ චන්ද්‍රිකා
V. පරාවර්තනය, අභ්‍යවකාශ යානා, ග්‍රහණය කිරීම, විශ්ලේෂණය

( )

10. GPS (Global Positioning Systems) හෙවත් ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය වර්තමානයේ නිරන්තරයෙන් භාවිතයට ගනු ලබන ක්ෂේත්‍රය වනුයේ,

I. කෘෂිකාර්මික කටයුතු II. ප්‍රවාහන කටයුතු III. ධීවර කටයුතු
IV. වෙළෙඳ කටයුතු V. කර්මාන්ත කටයුතු

( )

11. භූ කම්පන මධ්‍යස්ථාන කරා අවසන් වරට ළඟා වන භූ කම්පන තරංගය නම්,

I. දිගු තරංගය (L) II. සම්පීඩන තරංග (P)
III. ව්‍යාකෘති තරංග (S) IV. දිගු තරංග හා සම්පීඩන තරංග (L හා P)
V. සම්පීඩන තරංග සහ ව්‍යාකෘති තරංග ( P හා S )

( )

12. ශ්‍රී ලංකාවේ මයෝසීන හුණුගල් ව්‍යාප්ත වී ඇති ප්‍රදේශයක් නිවැරදිව දක්වෙන පිළිතුර වන්නේ,

I. කයිකාවල  II. මිනිහාගල් කන්ද  III. කින්නියා

IV. මාතලේ  V. හලාවත

( )

13. රසායනික වශයෙන් අවක්ෂේප වූ අවසාධිත පාෂාණ ගණයට අයත් වන පාෂාණ අඩංගු පිළිතුර තෝරන්න.

I. වැලිගල්, ශල්ක, වටපිඩු, අකුරු මැටි

II. පීට්, රට හුණු, කොරල්, ගල් අඟුරු

III. බොරළු, ජිප්සම්, යගල්, හුණු ගල්

IV. කාබනේට්,සල්ෆේට්, ක්ලෝරයිඩ්, සිලිකේට්

V. සල්ෆේට්, කාබනේට්, යගල්, ශල්ක

( )

14. ආක්‍රාන්ත යමහල් ආශ්‍රිතව සකස් වන භූ රූප තුනක් පහත දක්වා ඇත. එම භූ රූප A, B, C පිළිවෙලින් නම් කළ විට ලැබෙන පිළිතුර තෝරන්න.



A B C

I. ආස්තර, පාකොලිත, ඩයික  II. ලැකෝලිත, බැකෝලිත, ඩයික

III. ඩයික, බැකෝලිත, ලොපෝලිත  IV. ආස්තර, ලොපෝලිත, ඩයික

V. ඩයික, ආස්තර, ලැකෝලිත  ( )

15. ලෝකයේ මහාද්වීපික ස්කන්ධ හා තැටිවල හරබිම් ලෙස සැලකෙන පළිහ ප්‍රදේශ පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය මින් කුමක්ද?

I. ග්ලැසියර් මගින් සකස් වූ ප්‍රදේශයකි.  II. මහාද්වීපවල මධ්‍යයේ පිහිටි ප්‍රදේශයකි.

III. යමකම හා භූ කම්පන රහිත ප්‍රදේශයකි.  IV. උත්ක්ෂිප්ත වූ බිම් ප්‍රදේශයකි.

V. ගංගා ගලා යන භූමි ප්‍රදේශයකි.

( )

16. ගංගා නිම්නයක දක්නට ලැබෙන භූ රූප ලක්ෂණ තුනක් වන්නේ,

I. පිටාරතැන්න, ඩෙල්ටාව, දූනුවිල

II. දියලු අවාත්, ඩෙල්ටාව, කුමුටුවිල

III. ගං කණ්ඩිය, දූනුවිල, යාඩැම

IV. හැඩපළු ගංගාව, පිටාර තැන්න, ඉන්සෙල්බර්ග්

V. ගං දඟර, දූනුවිල, බහාඩා

( )

17. පහත රූප සටහනෙහි A, B, C ලෙස දක්වා ඇති ජලවහන රටා සහ ජලවහන ලක්ෂණ පිළිවෙලින් නිවරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,





A B C

I. A ගංගා පෝෂක ප්‍රදේශය B අරීය ජලවහන රටාව C ශාඛීය ජලවහන රටාව

II. A ශාඛීය ජලවහන රටාව B ගංගා පෝෂක ප්‍රදේශය C වලයාකාර ජලවහන රටාව

III. A අරීය ජලවහන රටාව B ශාඛීය ජලවහන රටාව C ගංගා පෝෂක ප්‍රදේශය

IV. A ජාලාකාර ජලවහන රටාව B දිය බෙත්ම C ගංගා පෝෂක ප්‍රදේශය

V. A ශාඛීය ජලවහන රටාව B සවිරාම ජල වහන රටාව C ගංගා පෝෂක ප්‍රදේශය

( )

18. වෙරළ ප්‍රදේශයක හරස්කඩක් දැක්වෙන පහත රූපයෙහි පිළිසෝදාව ක්‍රියාත්මක වන කලාපය වන්නේ මින් කුමක්ද?




I. A කලාපය II. B කලාපය III. C කලාපය

IV. D කලාපය V. E කලාපය

( )

19. පිලිපීන්, දූපත් ආශ්‍රිතව නිවර්තන වාසුළි හඳුන්වන්නේ,

I. ටයිෆුන් II. හරිකේන් III. සයික්ලෝන්

IV. විලිවිලිස් V. බැගියෝස්

( )

20. ලෝකයේ සාමාන්‍ය සුළං සංසරණ රටාව පිළිබඳව රූපසටහනක් මෙහි දක්වා ඇත. එහි අඩු පීඩන කලාප ලෙස සැලකෙන්නේ මින් කවර ප්‍රදේශයකද?




I. A හා D II. A හා B III. C හා D

IV. A හා C V. B හා D

( )

21. • ශීත ඍතුවේ උෂ්ණත්වය - $34^0C$
• ඉතා කටුක හා දිගු ශීත ඍතුවක් පවතී.
• වාර්ශික වර්ෂාපතනය 150mm - 250mm
• පැයට කි.මී.200ක වේගවත් සුළං රටාවක් පවතී.

ඉහත තොරතුරු වලින් දැක්වෙන ජගත් බියෝමය වනුයේ,

I. නිවර්තන වර්ෂා වනාන්තර
II. තෘණ බිම් බියෝමය
III. කේතුධර බියෝමය
IV. සෞම්‍ය කලාපික වනාන්තර
V. තුන්ද්‍රා බියෝමය

( )

22. සෞම්‍ය කලාපීය තෘණබිම් කිහිපයක ව්‍යාප්තිය A, B, C, D, වශයෙන් පහත සිතියමෙහි ලකුණු කර දක්වා ඇත. ඒවා අනුපිළිවෙලින් නිවරදිව දැක්වෙනුයේ,




| | | | | |
|---|---|---|---|---|
| I. | A පැම්පාස් | B ස්ටෙප්ස් | C ප්‍රෙයරීස් | D ඩවුන්ස් |
| II. | A ප්‍රෙයරීස් | B පැම්පාස් | C ස්ටෙප්ස් | D ඩවුන්ස් |
| III. | A ස්ටෙප්ස් | B ප්‍රෙයරිස් | C පැම්පාස් | D ඩවුන්ස් |
| IV. | A ප්‍රෙයරීස් | B ස්ටෙප්ස් | C ඩවුන්ස් | D පැම්පාස් |
| V. | A ස්ටෙප්ස් | B ඩවුන්ස් | C පැම්පාස් | D ප්‍රෙයරීස් |

( )

23. පහත රූප සටහන් වල දක්වා ඇත්තේ ලෝකයේ ප්‍රධාන වනාන්තර බියෝම කිහිපයක වෘක්ෂ ලතාවල ස්වභාවයයි.ඒවා නිවරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,



A B C D

I. A- සෞම්‍ය කලාපීය වනාන්තරB- කේතුධර වනාන්තරC- නිවර්තන වර්ෂා වනාන්තර D- තෘණ බිම්
II. A- සෞම්‍ය කලාපීය වනාන්තරB - නිවර්තන වර්ෂා වනාන්තර C- කේතුධර වනාන්තරD - තෘණ බිම්
III. A- නිවර්තන වර්ෂා වනාන්තර B - කේතුධර වනාන්තරC- තෘණ බිම්D - සෞම්‍ය කලාපීය වනාන්තර
IV. A- කේතුධර වනාන්තරBසෞම්‍ය කලාපීය වනාන්තරCතෘණ බිම්Dනිවර්තන වර්ෂා වනාන්තර
V. A- නිවර්තන වර්ෂා වනාන්තර Bසෞම්‍ය කලාපීය වනාන්තරCකේතුධර වනාන්තරDතෘණ බිම්

( )

24. වාර්ෂික ඒක පුද්ගල ජල පරිභෝජනය කොපමණද?

I. 1600 $m^3$ II.1700 $m^3$ III.1800 $m^3$
IV. 1900 $m^3$ V.2000 $m^3$

( )

25. ශ්‍රී ලංකාවේ වනජීවී රක්ෂිත ලෙස පවතින ජාතික වනෝද්‍යාන වනුයේ,

I. වික්ටෝරියා, රන්දෙනිගල, සමනල
II. යාල, විල්පත්තුව, උඩවලව
III. මින්නේරිය, ගිරිතලේ, ආනවිලුන්දාව
IV. හග්ගල, රිටිගල, යාල
V. සිංහරාජ, විල්පත්තු, නකල්ස්

( )

26. ජන සංඛ්‍යා වර්ධන ඉතිහාසයේ ඓතිහාසික අවධියේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ මින් කවරක්ද?

I. ජන සංඛ්‍යාව දෙගුණ වීමට ගතවන කාලය ක්‍රමයෙන් අඩු වීම.
II. වසර 200ක කාලයක් තුළ ජන සංඛ්‍යාව මිලියන 1000ක් වීම.
III. ජන සංඛ්‍යාවේ මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කිරීම.
IV. ආයු අපේක්ෂාව ක්‍රමයෙන් ඉහළ යාම.
V. ස්වභාවික වර්ධන අනුපාතය ක්‍රමයෙන් අඩු වීම.

( )

27. ජන සංඛ්‍යාවේ මූලික ගති ලක්ෂණ හතරක් වන්නේ,

I. වර්ධනය, විශාලත්වය, සංයුතිය හා ප්‍රවණතාව
II. ව්‍යාප්තිය, සංක්‍රමණය, විශාලත්වය හා වර්ධන සීඝ්‍රතාවය
III. විශාලත්වය, වර්ධනය, ව්‍යාප්තිය, හා සංයුතිය
IV. විශාලත්වය,සංයුතිය, ප්‍රවණතා, හා වර්ධන සීඝ්‍රතාවය
V. සංක්‍රමණය, වර්ධන සීඝ්‍රතාවය, ප්‍රවණතා, හා සංයුතිය

( )

28. වර්තමාන ලෝක ජනසංඛ්‍යා විශාලත්වය අනුව අවරෝහණ පිළිවෙලින් දැක්වෙන රටවල් වනුයේ,

I. බංග්ලාදේශය,රුසියාව, බ්‍රසීලය, ඉන්දියාව
II. චීනය, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දුනීසියාව
III. ඉන්දියාව, චීනය, බ්‍රසීලය, රුසියාව,
IV. චීනය, ඉන්දියාව, බ්‍රසීලය, ඉන්දුනීසියාව
V. ඉන්දියාව, චීනය, ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දුනීසියාව

( )

29. ඉහළ නාගරික ප්‍රතිශතයක් ඇතැයි ප්‍රක්ෂේපිත රටවල් කාණ්ඩය සහිත පිළිතුර වනුයේ,

I. ස්වීඩනය, ඉන්දියාව, ජර්මනිය, චීන හොංකොං විශේෂ පරිපාලන ඒකකය
II. නේපාලය, ඩෙන්මාර්කය, ප්‍රංශය, සිංගප්පූරුව
III. මහා බ්‍රිතාන්‍යය, ඊශ්‍රායලය, ආර්ජන්ටිනාව, කටාර්
IV. චීන මැකාවෝ විශේෂ පරිපාලන ඒකකය, උරුගුවේ, ආර්ජන්ටිනාව, සිංගප්පූරුව
V. චීන හොංකොං විශේෂ පරිපාලන ඒකකය, චීන මැකාවෝ විශේෂ පරිපාලන ඒකකය, සිංගප්පූරුව, කටාර්

( )

30. බොස් වොෂ් (Bos wash) නගරයාය පිහිටා තිබෙන්නේ,

I. කැනඩාවේය
II. ඇමරිකා එක්සත් ජනපදයේය
III. ජපානයේය
IV. චීනයේය
V. දකුණු කොරියාවේය

( )

31. පටු වූ පාදයක් සමග ඉහළට යන විට පළලින් වැඩි වී යන වයස් කාණ්ඩ සහිත ජන සංඛ්‍යා පිරමීඩයකින් දැක්වෙනුයේ ජන සංඛ්‍යාව,

I. සීඝ්‍රයෙන් අඩු වන බවය.
II. සීඝ්‍රයෙන් වැඩි වන බවය.
III. ක්‍රමයෙන් අඩු වන බවය.
IV. ස්ථාවර මට්ටමක පවතින බවය.
V. ප්‍රශස්ත මට්ටමක් කරා ළඟා වන බවය.

( )

32. පහත ප්‍රස්තාරයෙන් දැක්වෙන්නේ 1960 - 2020 දක්වා ලෝක ජන සංඛ්‍යා වර්ධනය සහ වගා කළ හැකි බිම් ප්‍රමාණය දැක්වෙන ප්‍රස්තාර සටහනකි. ඉන් එළඹිය හැකි වඩාත් නිවරදි නිගමනය වනුයේ,




I. ජන සංඛ්‍යා වර්ධනයත් සමග වගා කළ හැකි බිම් ප්‍රමාණය වර්ධනය වෙමින් පවතී.
II. ජන සංඛ්‍යා වර්ධනයත් සමග වගා කළ හැකි බිම් ප්‍රමාණය ස්ථාවර වෙමින් පවතී.
III. ජන සංඛ්‍යාවේ පහළ යාමක් පෙන්නුම් කරන බැවින් වගා කළ හැකි බිම් ප්‍රමාණයේ වර්ධනයක් පෙන්නුම් කරයි.
IV. ජන සංඛ්‍යාවේ පහළ යාමක් පෙන්නුම් කරන බැවින් වගා කළ හැකි බිම් ප්‍රමාණයේ වෙනසක් සිදු නොවේ.
V. ජන සංඛ්‍යා වර්ධනයත් සමග වගා කළ හැකි බිම් ප්‍රමාණයේ සීඝ්‍ර පහත වැටීමක් පෙන්නුම් කරයි.

( )

33. හරිත විප්ලවය ආශ්‍රිතව භාවිතා කළ නවීන කෘෂිකාර්මික ශිල්පීය ක්‍රමයක් නොවන්නේ,
I ගොවිපල යාන්ත්‍රිකරණය වීම.
II රසායනික පොහොර භාවිතය.
III කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා කිරීම.
IV තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම.
V ඓන්ද්‍රිය පොහොර භාවිතා කිරීම.

( )

34. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය නවීකරණය කිරීමේ පියවරක් ලෙස ඓන්ද්‍රිය පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා පිහිටුවන ලද කාබනික පොහොර මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ කුමන ස්ථානයේද?
I. බටඅත II. ගන්නෝරුව III. හලාවත පිටිපන
IV. මාකඳුර ගෝනවිල V. ගාල්ල ලබුදූව

( )

35. ලෝකයේ ගල් අඟුරු නිෂ්පාදනයේ ප්‍රධාන අපනයනකරුවෙකු හා ආනයනකරු පිළිවෙලින් දැක්වෙනුයේ,
I. චීනය,ජපානය II. ඉන්දුනීසියාව,තායිවානය
III. ඉන්දුනීසියාව,දකුණු කොරියාව IV. ඕස්ට්‍රේලියාව,ජපානය
V. රුසියාව,ජපානය

( )

36. යපස් වල ඇති ගුණාත්මක බව අනුව වඩාත්ම ඉහළ වටිනාකමක් ඇති යපස් වර්ගය වන්නේ,
I. සිඩරයිට් II. ලිමොනයිට් III. හෙමටයිට්
IV. මැග්නටයිට් V. මිග්මටයිට්

( )

37. ශ්‍රී ලංකාවේ ධමනි මිනිරන් වැඩිම ප්‍රමාණයක් මිලදී ගනු ලබන රටවල් වන්නේ,
I. ජපානය,ජර්මනිය II. ජපානය,ඇමරිකා එක්සත් ජනපදය
III. ඇමරිකා එක්සත් ජනපදය,ජර්මනිය IV. ජර්මනිය,දකුණු කොරියාව
V. ජපානය ,චෙක් ජනරජය

( )

38. පැසිෆික් - ආසියා සංචාරක සංගමයේ (PATA) මූලස්ථානය පිහිටුවා ඇත්තේ කිනම් නගරයේද?
I. ටෝකියෝ II. හොංකොං III. හොනලුලු
IV. තායිපෙ V. මැනිලා

( )

39. සංවර්ධනය වෙමින් පවතින රටවල සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට සහයෝගය ලබා දීම සඳහා පිහිටුවා ඇති සංවිධානයක් වනුයේ,

I. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය. (UNWTO)
II. පැසිෆික් ආසියා සංචාරක සංගමය. (PATA)
III. අග්නිදිගආසියානු සංගමය.(ASEAN)
IV. දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ප්‍රදේශය. (SAFTA)
V. දකුණු ආසියාතික කලාපීය සහයෝගීතා සංවිධානය.(SAARC)

( )

40. පහත සිතියමේ ශ්‍රී ලංකාවේ වැඩිම සංචාරක ආකර්ෂණයක් දිනාගත් ප්‍රදේශ දක්වා ඇත. එම ප්‍රදේශ අනුපිළිවෙලින් දැක්වූ විට වඩාත් නිවරදි පිළිතුර වනුයේ,




| | | | | | |
|---|---|---|---|---|---|
| I | A පුත්තලම | B අනුරාධපුරය | C කතරගම | Dරත්නපුරය | E රත්තොට |
| II | Aකල්පිටිය | Bඅනුරාධපුරය | Cකතරගම | D සිංහරාජය | E සීගිරිය |
| III | Aහලාවත | Bවව්නියාව | Cකිරින්ද | D කොග්ගල | Eමාතලේ |
| IV | Aකල්පිටිය | Bපොළොන්නරුව | Cකුමන | Dවස්ගමුව | Eරිටිගල |
| V | Aකල්පිටිය | Bඅනුරාධපුරය | Cකුමන | D හෝර්ටන්තැන්න | Eසීගිරිය |

( )

## II කොටස

01. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කරන ලද 1:50 000 පරිමාණයේ මතුගම භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත.එහි සමෝච්ච රේඛා අන්තරය මීටර් 20 කි.එම සිතියම පදනම්කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. සිතියමෙහි A, B, C, හා D ලෙස ලකුණු කර ඇති භෞතික ලක්ෂණ හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 02)

II. සිතියම්ගත ප්‍රදේශය තුළ දැකිය හැකි ප්‍රධාන භූමිපරිභෝග වර්ග 4ක් නම්කරන්න. (ලකුණු 02)

III. සිතියම්ගත ප්‍රදේශයෙහි E - F ලෙස දක්වා ඇති රේඛාව ඔස්සේ හරස් කඩක් අඳින්න. (ලකුණු 04)

IV. සිතියමෙහි D ලෙස දක්වා ඇති චතුරස්‍රය දෙගුණයක් විශාල කර අඳින්න. (ලකුණු 02)

V. ඉහත ඔබ (IV) හි අඳින ලද චතුරස්‍රයට උචිත රේඛීය පරිමාණය ඇඳ දක්වන්න. (ලකුණු 04)

VI. සිතියම්ගත ප්‍රදේශයෙහි භූ විෂමතාවය සහ භූමි පරිහරණය අතර ඇති සබඳතාවය විස්තර කරන්න. (ලකුණු 06)

02. ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි සම්මත සංකේත හා වර්ණ යොදා ගනිමින් පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

(ලකුණු 1×10 =10)

| | | | |
|---|---|---|---|
| I. | ෆ්ලෝරිඩා සමුද්‍ර සන්ධිය | II. | වික්ටෝරියා විල |
| III. | ඩෙකෑන් සානුව | IV. | මොසැම්බික් ඕඩය |
| V | පැනමා බොක්ක | VI. | රතු මුහුද |
| VII. | යෝක් තුඩුව | VIII. | මැඩගස්කරය |

IX. OPEC සංවිධානයේ මූලස්ථානය පිහිටි රට

X 2020 වසරේ ඔලිම්පික් ක්‍රීඩා උළෙල පැවැත්වෙන රට

## III කොටස

01. I. ප්‍රායෝගික භූගෝල විද්‍යාවේ භාවිතා වන ක්‍රම ශිල්ප දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. ඔබ ඉහත (1) හි දක්වන ලද ශිල්පීය ක්‍රම දෙක භූගෝල විද්‍යා අධ්‍යයන කටයුතු වල දී යොදා ගනු ලබන ආකාරය කෙටියෙන් දක්වන්න.

(ලකුණු 03)

III. භූ ලක්ෂණ සිතියම් හා තේමා සිතියම් යනු මොනවාදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 04)

IV. භූ ලක්ෂණ සිතියම්, සිතියම් විද්‍යාත්මක ක්‍රමවේදයක් ලෙස යොදාගත හැකි ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06)

02. I. නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප දෙකක් නම් කරන්න.

(ලකුණු 02)

II. නව සිතියම් විද්‍යාත්මක ක්‍රමශිල්ප වල හඳුනා ගත හැකි පොදු ලක්ෂණ තුනක් නම් කරන්න.

(ලකුණු 03)

III. භූගෝලීය තොරතුරු පද්ධතියෙහි දත්ත ගබඩා කිරීමේ ආකෘති දෙකෙහි වෙනස්කම් කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

IV. ගුණාත්මක සිතියමක් නිර්මාණයට භූගෝලීය තොරතුරු පද්ධතියෙන් ලැබෙන දායකත්වය කරුණු තුනක් ඇසුරෙන් විමසන්න. (ලකුණු 06)

03. I. සංගහනය හා නියැදිය යන්න සැකෙවින් හඳුන්වන්න.

(ලකුණු 02)

II. දත්ත නිරූපණය සඳහා යොදා ගන්නා මිනුම් අතර අපකිරණය පිළිබඳ මිනුම් 3ක් නම් කරන්න.

(ලකුණු 03)

III.කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් අතුරින් දෙකක් උදාහරණ සහිතව කෙටියෙන් පහදන්න.

(ලකුණු 04)

IV. සරල සංඛ්‍යා ශ්‍රේණියක් සහ සංකීර්ණ සංඛ්‍යා ශ්‍රේණියක් සමූහිත දත්ත ව්‍යාප්තියක් බවට පත් කරන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

04. පහත වගුවෙහි දැක්වෙන්නේ පන්තියක ළමුන් 40 දෙනෙකු භූගෝල විද්‍යාව විෂයට ලබාගත් ලකුණුය.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 48 | 36 | 82 | 33 | 66 | 58 | 75 | 35 |
| 50 | 52 | 90 | 42 | 76 | 41 | 95 | 45 |
| 45 | 23 | 56 | 76 | 89 | 23 | 82 | 54 |
| 63 | 18 | 48 | 55 | 22 | 35 | 37 | 71 |
| 74 | 74 | 26 | 50 | 13 | 55 | 27 | 95 |

I. ඉහත වගුවේ දත්ත උපයෝගී කරගෙන සංඛ්‍යාත ව්‍යාප්ති වගුවක් සකසන්න. (පන්ති ප්‍රාන්තර 6 කට සීමාකරන්න.) (ලකුණු 04)

II. එම දත්ත වගුව යොදා ගෙන මධ්‍යස්ථය ගණනය කරන්න. (ලකුණු 05)

III. ඔබ ඉහත (I) හි සකසන ලද සංඛ්‍යාත ව්‍යාප්ති වගුව පදනම් කරගෙන ජාල රේඛය හා සංඛ්‍යාත බහුඅස්‍රය නිර්මාණය කරන්න. (ලකුණු 06)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

**භූගෝල විද්‍යාව - II**

**Geography - II**

22 | S | II

පැය 03 යි

**Time: 03 hours**

I කොටස -

**සැලකිය යුතුයි :**
**එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. I. පද්ධතියක් යනු කුමක්ද? (ලකුණු 02)

II. පරිසර පද්ධතියක ශක්ති ගලනය රූප සටහනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

III. ජෛව ගෝලීය පද්ධතිය සකස් වී ඇති සංවිධාන මට්ටම් නම් කර ඒවා වෙන් වශයෙන් උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

IV. වර්තමානයේ වර්ධනය වී ඇති මිනිස් ක්‍රියාකාරකම් හමුවේ පරිසර පද්ධතිවල සමතුලිතතාවය බිඳ වැටී ඇති ආකාරය උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

02. I. පාංශු නිර්මාණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන සාධක හතරක් නම් කරන්න. (ලකුණු 02)

II. ඉහත (I) හි ඔබ සඳහන් කළ සාධක අතුරෙන් දෙකක් තෝරා ගෙන ඒවා පාංශු නිර්මාණ ක්‍රියාවලියට දායකවන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

III. (අ) පාංශු පැතිකඩක රූප සටහනක් අඳින්න. (ලකුණු 02)
(ආ) ඔබ විසින් අඳින ලද පාංශු පැතිකඩෙහි හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ දෙකක් විස්තර කරන්න. (ලකුණු 04)

IV. පාංශු ඛාදනය හා පාංශු හායනය අතර වෙනස පහදා ශ්‍රී ලංකාවේ පාංශු හායනය තීව්‍ර කිරීමට හේතු වී ඇති මානව ක්‍රියාකාරකම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. I. දේශගුණික වෙනස්වීම් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

II. දේශගුණික වෙනස්වීම් ඇති කිරීම සඳහා බලපාන භෞතික සාධක දෙකක් සහ මානව සාධක දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

III. හරිතාගාර ආවරණය හේතුවෙන් ඇතිවන අහිතකර ප්‍රතිවිපාක තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

IV. දේශගුණික වෙනස්වීම් අවම කිරීම සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය කෙබඳු ද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 06)

04. I. ස්වභාවික උපද්‍රව හා ස්වභාවික ආපදා අතර වෙනස පහදන්න. (ලකුණු 02)

II. ගෝලීය දේශගුණික වෙනස්වීම් හමුවේ ඇතිවන නියඟය ආපදාවක් බවට පත්වීම කෙරෙහි බලපානු ලබන හේතු 3 ක් පහදන්න. (ලකුණු 06)

III. නියඟය,භෞතික හා මානුෂ පරිසරයට සිදු කරනු ලබන බලපෑම කරුණු තුනක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 06)

iv. ස්වභාවික ආපදා තීව්‍ර කිරීමට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 06)

**II කොටස**

05. I. ජනාවාසයක් හඳුනා ගත හැකි මූලික සංරචක හතරක් නම් කරන්න. (ලකුණු 02)

II. නාගරික ජනාවාසයක් ග්‍රාමීය ජනාවාසයකින් වෙනස් වන්නේ කවර නිර්ණායකයන් පදනම් කරගෙනද යන්න විමසන්න. (ලකුණු 06)

III. පහත දැක්වෙන ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනාවාස අතුරෙන් දෙකක හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ උදාහරණ සපයමින් විස්තර කරන්න.
වතු ජනාවාස.
පහතරට වියළි කලාපීය වැව් ගම්මාන.
ධීවර ජනාවාස (ලකුණු 06)

IV. ශ්‍රී ලංකාවේ මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ස්ථාපනය කරන ලද නව ජනාවාස පද්ධතියෙහි කැපී පෙනෙන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. I. හරිත විප්ලවය යනු කුමක්ද? (ලකුණු 02)

II. ජාන තාක්ෂණය කෘෂිකර්මාන්තයට හඳුන්වාදීම හේතුවෙන් උද්ගත වී ඇති සමාජයීය හා පාරිසරික ගැටළු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

III. ඓන්ද්‍රිය කෘෂිකර්මය යනු කුමක්දැයි හඳුන්වා එය ක්‍රියාවට නැංවීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේද තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

IV. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය වර්තමානයේ මුහුණ පා ඇති අභියෝග තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

07. I. නිෂ්කර්ෂක කර්මාන්ත හා නිෂ්පාදන කර්මාන්ත අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02)

II. නිෂ්පාදන කර්මාන්තයක් ස්ථානගත වීමට බලපානු ලබන සාධක 4ක් දක්වා ඉන් දෙකක් කර්මාන්ත ස්ථානගත වීමට බලපානු ලබන ආකාරය නිදසුන් ඇසුරෙන් පහදන්න. (ලකුණු 06)

III. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ඛනිජ සම්පත් දක්වනු ලබන දායකත්වය කරුණු තුනක් ඇසුරින් විමසන්න. (ලකුණු 06)

IV. ඛනිජ සම්පත් උපයෝජනයේදී ඇතිවනු ලබන පාරිසරික හානිය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

08. I. පහත සිතියමෙහි සලකුණුකර ඇති ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාප අතුරින් 4 ක් නම් කරන්න. (ලකුණු 02)




II. සංචාරකයින් ශ්‍රී ලංකාව සංචාරක ස්ථානයක් ලෙස තෝරා ගැනීමට බලපා ඇති හේතු තුනක් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

III. සංචාරක කර්මාන්තය සාමාජයීය හා පාරිසරික වශයෙන් බලපෑම් ඇතිකරනු ලබන ආකාරය කරුණු තුනක ඇසුරින් පහදන්න. (ලකුණු 06)

IV. සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ලකුණු 06)